# මත්ද්‍රව්‍ය දුර්භාවිතය, නිවාරණය හා පාලනය සඳහා වන ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය, රටතුල මත්ද්‍රව්‍ය නීති විරෝධීව නිෂ්පාදනය කිරීමත්, ප්‍රවාහනය කිරීමත් ඒවායේ දුර්භාවිතයත්, මත්ලෝලීන්ගේ සෞඛ්‍ය කෙරෙහි මත්ද්‍රව්‍ය නිසා සිදුවන අහිතකර බලපෑමත්, මත්ද්‍රව්‍ය සම්බන්ධ අපරාධවල වර්ධනයත්, එමගින් විනාශ වී යන මානව, ස්වභාවික හා මූල්‍ය සම්පත් මෙන්ම මත්ද්‍රව්‍ය දුර්භාවිතය හේතුකොටගෙන සිදුවන පුද්ගල - පවුල් සහ විවිධ ජන කොටස්වල විනාශය ගැනත් මනා අවබෝධයකින් සිටී.

එමෙන්ම, මත්ද්‍රව්‍ය හා අදාල අන්තර්ජාතික වගකීම් ගැනද, විශේෂයෙන් ශ්‍රී ලංකාව පාර්ශවකරුවකු වන 1961 මත්කාරක ඖෂධ වර්ග පිළිබඳ කේවල ප්‍රඥප්තියෙන්ද (Single Convention on Narcotics Drugs, 1961) 1971 මනෝ ආවර්තන ද්‍රව්‍ය පිළිබඳ ප්‍රඥප්තියෙන්ද (Convention on Psychotropic Subslances, 1971) හා 1988 මත්කාරක ඖෂධ හා මනෝ ආවර්තන ද්‍රව්‍යයන්ගේ නීති විරෝධී ප්‍රවාහනයට එරෙහි එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියෙන්ද (United Nations Convention Against Illicit Traffick In Narcotics Drugs and Psychotropic Substances, 1988 ) පැන නැගී ඇති වගකීම් ගැන ලංකාව මනාව දැනුවත්ව සිටී.

මීට දශකයකට අධික කාලයකට පෙරාතුව සම්පාදනය කරනු ලැබූ හා දැනට ක්‍රියාත්මක වන ජාතික ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීමෙන්, මත්ද්‍රව්‍ය පිළිබඳ ගැටළුවට දේශීයව මෙන්ම අන්තර්ජාතික වශයෙනුත් මිහිණදීම සඳහා ඇති ස්වකීය දේශපාලන අභිලාෂය හා අධිෂ්ඨානය රජය යළි යළිත් සහතික කරයි.

රජයේ විෂය පථයට අන්තර්ගත සියලු ආයතන මෙම ජාතික මත්ද්‍රව්‍ය ප්‍රතිපත්තියට එකගව ක්‍රියාකළ යුතු වන්නේය. එමෙන්ම, අදාළ රාජ්‍ය නොවන සංවිධානද රජයේ මෙමෙ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙහිලා සක්‍රීය පාර්ශවකරුවන් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම ප්‍රතිපත්ති රාමුව තුළ පෞද්ගලික අංශයේ ආයතනයන්ද තම සමාජීය වගකීම් ඉටුකිරීම මත්ද්‍රව්‍ය දුර්භාවිතය නිවාරණය කිරීමෙහි හා පාලනය කිරීමෙහිලා බෙහෙවින් වැදගත් වනු ඇත.

මත්ද්‍රව්‍ය ගැටළුව සම්බන්ධයෙන් රජයේ ඒකායන ඉලක්කය වන්නේ 2010 වර්ෂය වන විට මත්ද්‍රව්‍ය සැපයුම හා මත්ද්‍රව්‍ය භාවිතය හැකි අන්තිම මට්ටම දක්වා අඩු කිරීමය. මෙම ඉලක්කය ජය ගැනීම උදෙසා මත්ද්‍රව්‍ය නීතිය ක්‍රියාත්මක කරන සියළුම ආයතනත්, පළාත් සහ ප්‍රාදේශීය පරිපාලනයන් ඇතුලත් මත්ද්‍රව්‍ය සම්බන්ධ ඍජුව ක්‍රියා කරන රාජ්‍ය ආයතනත්, අවසන් ඉලක්කය සඳහා දායක විය හැකි වෙනත් නියෝජ්‍යාතනද, රාජ්‍ය නොවන සංවිධාන හා පෞද්ගලික අංශයේ නියෝජ්‍යාතනද අඛණ්ඩව ක්‍රියාත්මක වනු ඇත.

මත්ද්‍රව්‍ය දුර්භාවිතය පාලනය කිරීම සඳහා වඩා පුළුල් මානව සංවර්ධන ප්‍රවේශයක් රජය විසින් තෝරාගනු ලබන අතර එහිදී මත්ද්‍රව්‍ය දුර්භාවිතය හා දිළිඳු බව අඩුකිරීමත, අපරාධ වැළැක්වීම හා සෞඛ්‍ය තත්වය නගා සිටුවීමත් අතර සම්බන්ධය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ.

මත්ද්‍රව්‍ය ගැටළුවේදී වඩාත්ම ඵලදායී ප්‍රවේශය වන්නේ, පුළුල්, සමතුලිත, හා සම්බන්ධීකරණය වූ උපාය මාර්ගයක්ය යන්න රජයේ විශ්වාසයයි. එවැනි උපාය මාර්ගයක් තුල සැපයුම පාලනය කිරීම හා ඉල්ලුම අඩු කිරීම යන දෙකරුණ අන්‍යොන්‍යව ශක්තිමත්ව ක්‍රියාත්මක වෙයි. හවුල් වගකීම පිළිබඳ දැඩි හැඟීම මෙහි ප්‍රතිමානය වන්නේය.

මත්ද්‍රව්‍ය පාලන උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමෙහි නිරත රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන සංවිධාන, පෞද්ගලික අංශය මෙන්ම වෙනත් සංවිධානද මෙහි පහත එක් එක් උපාය මාර්ග යටතේ සඳහන් නිශ්චිත ප්‍රතිපත්ති මාර්ගෝපදේශ පිළිපදිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

# 1. ප්‍රතිපත්තිය

ප්‍රතිශෝධිත ජාතික ප්‍රතිපත්තිය මෙසේය.

අ. නීති විරෝධී මතදුවය නිෂ්පාදනය, නීති විරෝධීව මත්ද්‍රව්‍ය මෙරටට ගෙන්වීම, ප්‍රවාහනය, වෙළඳාම හා ඒවා පාවිච්චියට එරෙහිව නීතිය ප්‍රබල ලෙස ක්‍රියාවේ යෙදවීම.

ආ. පාලිත මත්ද්‍රව්‍ය සහ පාලනයට යටත් පුරෝගාමී රසායන ද්‍රව්‍ය (precursor chemicals) ආනයනය කිරීම, අපනයනය කිරීම සහ බෙදාහැරීම සාර්ථක ලෙස නිරීක්ෂණය කිරීම.

ඇ. මත්ද්‍රව්‍ය පාවිච්චිය වැළක්වීම සහ මත්ද්‍රව්‍ය දුර්භාවිතයෙහි අහිතකර ප්‍රතිවිපාක අවම කිරීම.

ඈ. මත්ද්‍රව්‍ය දුර්භාවිතය, නිවාරණය හා පාලනය කිරීම සම්බන්ධ කලාපීය හා අන්තර්ජාතික ක්‍රියාකාරී පියවරයන්ට ආධාර දීම.

# 2. ප්‍රතිපත්ති රාමුව

ප්‍රතිපත්ති රාමුව

ප්‍රතිපත්ති රාමුව සැලකිය යුත්තේ මත්ද්‍රව්‍ය නිවාරණ හා නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන ඒකාබද්ධ කිරීමේ හා සම්බන්ධ කිරීමේ යාන්ත්‍රණයක් වශයෙනුත්, උපදෙස් ලබාගැනීමේ මූලාශ්‍රයක් ලෙසිනුත්ය.

## 2.1 නීති විරෝධී මත්ද්‍රව්‍ය නිෂ්පාදනය, මත්ද්‍රව්‍ය නීති විරෝධීව මෙරටට ගෙන්වීම, ප්‍රවාහනය, වෙළඳාම,හා ඒවා පාවිච්චියට එරෙහිව නීතිය ප්‍රබල ලෙස ක්‍රියාවේ යෙදවීම සඳහා වන ප්‍රතිපත්ති රාමුව

මත්ද්‍රව්‍ය නීති විරෝධීව ලබාගැනීම අවම කිරීමත්, මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත රෝග වැළැක්වීමත්, මත්ද්‍රව්‍ය දුර්භාවිතය නිවාරණය කිරීමට උචිත පරිසරයක් නිර්මාණය කිරීමත් සඳහා නීතිය යුහුසුලුව ක්‍රියාවේ යෙදවීමට වග බලා ගැනීම අවශ්‍යයය.

අ. නීත්‍යානුකූල ඖෂධීය ප්‍රයෝජනය සඳහා මත්කාරක ඖෂධ වර්ග හා මනෝආවර්තක ද්‍රව්‍ය (Narcotic Drugs and Psychotropic Substances) අවශ්‍ය පමණින් සපයාදීමට සෞඛ්‍ය බලධාරීහු සහතික වෙති. ඒ සමගම එකී ද්‍රව්‍ය අයුතු ලෙස භාවිතා කිරීම වැළැක්වීමත්, දුර්භාවිතය වැළැක්වීමත් සඳහා එළදායී ක්‍රියාමාර්ගද බලධාරීන් විසින් සඳන්වා දෙනු ඇත.

ආ. මත්ද්‍රව්‍ය නීතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රමුඛ ආයතනය වන පොලිස් දෙපාර්තමේන්තුව විසින්, රේගු දෙපාර්තමේන්තුව, සුරාබදු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා යුධ හමුදාව, නාවික හමුදාව සහ ගුවන් හමුදාවත් අනෙක් අදාල ආයතනවලත් සහාය ඇතිව මත්ද්‍රව්‍ය ප්‍රවාහනය අවම කිරීමටත්, නීති විරෝධී මත්ද්‍රව්‍ය වීදි මට්ටමින් ලබාගැනීමට හැකිවීම අවම කිරීමටත් සියලු උත්සාහයන් දරනු ඇත. මත්ද්‍රව්‍ය පිළිබඳ නීතිය ක්‍රියාත්මක කිරීමේ සාර්ථකත්වය මැනීමේ මිණුම් දණ්ඩ වන්නේ වීථි මට්ටමින් මත්ද්‍රව්‍ය පවතින ප්‍රමාණයයි.

ඇ. මෙරටට ඇතුළුවිය හැකි සියලු ප්‍රවේශ ස්ථාන සඳහා වඩා සාර්ථක මත්ද්‍රව්‍ය අනාවරණ හා නිවාරණ පද්ධති රේගු දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ඇති අතර, එම දෙපාර්තමේන්තුව විසින් රජය පාර්ශවකරුවකු වන එක්සත් ජාතීන්ගේ හා සාර්ක් සංවිධානයන්හි අදාළ සම්මුති අවශ්‍යතා ඉටු කරනු ඇත.

ඈ. සාඅර්ථක මත්ද්‍රව්‍ය පාලන පද්ධතියක් ගොඩ නගා ගැනීම සඳහා දැනට පවත්නා නීති හා භාවිතයන් සමාලෝචනය කිරීමටත්, සංශෝධනය කිරීමටත් නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන විසින් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය කාර්යක්ෂමව යොදා ගනු ඇත.

ඉ. නීතිය කෙටුම්පත් කිරීමේදී හෝ එය සංශෝධනය කිරීමේදී අදාළ එක්සත් ජාතීන්ගේ මාදිලි නීති මෙන්ම එක්සත් ජාතීන්ගේ සම්මුතීන් හා සාර්ක් සම්මුතීන් කෙරෙහිද නිසි සැලකිල්ල යොමු කරනු ලැබේ.

ඊ. මත්ද්‍රව්‍ය පාලන ක්ෂේත්‍රය තුළ නීතිය ක්‍රියාත්මක කිරීමේ සියලු මට්ටම් වලදී සිදුවිය යුතු මානව සම්පත් සංවර්ධනය අදාල ආයතන ප්‍රධානීන් විසින් හඳුනාගනු ඇත. ඒ අනුව ආයතන ප්‍රධානීන් අදාල පිරිස් සඳහා මත්ද්‍රව්‍ය අනාවරණය කරගැනීම, ඒ පිළිබඳ විමර්ශනය කිරීම, නඩු පැවරීම හා දඬුවම් ලබාදීම සම්බන්ධව ප්‍රමාණවත් පුහුණුවක් ලබා දී සිය ආයතනවල මෙහෙයුම් හැකියාව ශක්තිමත් කරනු ඇත. තවද ප්‍රමාණවත් සම්පත් සැපයීමටද, විශේෂඥභාවය ලත් නිළධාරීන්ගෙන් උපරිම ප්‍රයෝජනය ලබා ගැනීමටද ඔවුන් කටයුතු කළ යුතුය.

උ. නීතිය ක්‍රියාත්මක කිරීමේ නිළධාරීන් හෝ සන්නද්ධ හමුදා සාමාජිකයින් අතින් සිදුවිය හැකි මත්ද්‍රව්‍ය දුර්භාවිතය ආශ්‍රිත වැරදි සම්බන්ධයෙන් නිසි පියවර ගැනීමට ඔවුන් සඳහා සැකසුණු චර්යා පද්ධතියක් එම ආයතන තුළ ස්ථාපනය කරනු ඇත.

ඌ. නීතිය ක්‍රියාතමක කිරීමේ ආයතනවල කාර්ය මණ්ඩල සඳහා නියමිත ඇගයීමේ හා තිළිණ ප්‍රධනය කිරීමේ යාන්ත්‍රණයක් හඳුන්වා දෙනු ලැබේ. පුහුණුවලත්, කාර්යක්ෂම නිළධාරීන් වෙනත් අංශ වෙත මාරුකිරීම වැළැක්වීම සඳහා ස්ථානමාරු ලබාදීමේ ක්‍රමය ප්‍රතිශෝධනය කරනු ලැබේ.

එ. මත්ද්‍රව්‍ය හා සම්බන්ධ නඩු ඇසීම කඩිනම් කිරීමත්, මත්ද්‍රව්‍ය වන නඩු භාණ්ඩ සැලකිල්ලෙන් පරිහරණය කිරීම හා ඒවා විනාශ කිරීම සඳහා සම්මත පරිපාටියක් ස්ථාපිත කිරීමත්, දඬුවම් ක්‍රමවල පවත්නා ප්‍රබල වෙනස්කම් අවම කිරීමත් ආදී කරුණු ගැන අධිකරණය මෙන්ම අනෙක් අදාළ රාජ්‍යායතනද අවශ්‍ය පියවර ගනු ඇත.

ඒ. රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට අවශ්‍ය උපකරණ, සේවක සංඛ්‍යාව හා පුහුණු කිරීමේ පද්ධතියක් සපයා එඅය නිසි පරිදි සර්ව සම්පූර්ණ කරනු ලැබේ. ඒ අතර එකී දෙපාර්තමේන්තුව සිය මත්ද්‍රව්‍ය විශ්ලේෂණ කටයුතු සඳහා සෙසු ආයතනවල පහසුකම් වර්ධනය කොට ප්‍රයෝජනයට ගනු ඇත.

ඔ. නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන සහ අනෙක් අදාළ රජයේ ආයතන ගංජා වැවීම, ඒවා සකස් කිරීම හා ප්‍රවාහනය කිරීම නතර කිරීමට පියවර ගනු ඇත.

ඕ. ආයුර්වේද දෙපාර්තමේන්තුව, නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන්වල සහාය ඇතිව ගංජා හා අබිං අඩංගු ආයුර්වේද නිෂ්පාදන නීති විරෝධීව සකස් කිරීම සාර්ථක ලෙස නතර කරනු ඇත.

## 2.2 මත්ද්‍රව්‍ය හා පාලනයට යටත් පුරෝගාමී රසායන ද්‍රව්‍ය ආනයනය, අපනයනය හා බෙදාහැරීම සාර්ථකව කිරීම සඳහා වන ප්‍රතිපත්ති රාමුව

අ. ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය පාලන සන්ධාන යටතේ, මත්කාරක ඖෂධ ආනයනය හා අපනයනය සඳහා සහතිකපත් හා අවසරපත් නිකුත් කිරීමට නිසි බලයලත් ජාතික අධිකාරීන් වෙත බලය දෙනු ලැබේ. එසේම 1988 මත්කාරක ඖෂධ හෝ මනෝ ආවර්තන ද්‍රව්‍යයන්ගේ නීති විරෝධී ප්‍රවාහනයට එරෙහි එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ 12 වෙනි වගන්තියේ අඩංගු විධිවිධානවලට අනුකූලව පුරෝගාමී හා අත්‍යවශ්‍ය රසායන ද්‍රව්‍ය පිළිබඳ ජාතික පාලන විධි ක්‍රමවත් කිරීමට හෝ ක්‍රියාවේ යෙදවීමට බලය දෙනු ලැබ ඇති නිසි බලයලත් ජාතික අධිකාරීන් එකී සම්මුතීන්හි අවශ්‍යතා සාර්ථකව ඉටු කරයි.

ආ. මත්ද්‍රව්‍ය හා පාලනය යටතේ පවත්නා පුරෝගාමී රසායන ද්‍රව්‍ය ආනයනය, අපනයනය, ගබඩා කිරීම හා බෙදාහැරීම සම්බන්ධ පවත්නා පරිපාටි, භාවිතාවන්, නියමයන් හා නීති අදාළ අධිකාරි විසින් කළින් කල සමාලෝචනය කරණු ඇත.

ඇ. අදාළ අධිකාරීවලට සහ නීතිය ක්‍රියාත්මක කරන ආයතන්වලට බලපත්‍ර දීම / අනුමැතිය දීම මගින් පාලනයට යටත් පුරෝගාමී රසායන ද්‍රව්‍ය ප්‍රවාහනය, අපසරනය (diversion) හා අයුතු භාවිතය වැළැක්වීම ශක්තිමත් කරනු ලැබේ.

## 2.3 මත්ද්‍රව්‍ය පාවිච්චිය වැළැක්වීම හා මත්ද්‍රව්‍ය දුර්භාවිතයෙහි අහිතකර ප්‍රතිවිපාක අවම කිරීම සඳහා වන ප්‍රතිපත්ති රාමුව

### 2.3.1 නිවාරණය, අධ්‍යාපනය හා පුහුණුව

අ. නීත්‍යානුකුල මත්ද්‍රව්‍ය වර්ග පාවිච්චි කිරීම (අවසරලත් දුම්කොළ නිෂ්පාදන, අවසරලත් මධ්‍යසාර නිෂ්පාදන) සෑම මට්ටමකදීම අධෛර්යමත් කළ යුතුය. ප්‍රසිද්ධ ගොඩනැගිලි පරිශ්‍රවලදී මෙන්ම ප්‍රසිද්ධ ස්ථාන වලදීද අවසරලත් මත්ද්‍රව්‍ය පාවිච්චිය අදාල අමාත්‍යාංශ / පළාත් ආණ්ඩු ආයතන හෝ අදාළ අධිකාරී විසින් අධෛර්යමත් කළ යුතුය. සෑම ආකාරයෙන්ම කෙරෙන මත්ද්‍රව්‍ය ප්‍රචාරණ කටයුතු අධෛර්යමත් කළ යුතුය.

ආ. පාසල්, විශ්ව විද්‍යාල, නිෂ්පාදන කර්මාන්තශාලා, ආරක්ෂක හමුදා, පොලීසිය, වැඩපොළවල්, වතු සහ රෝහල් වැනි විශාල ආයතනවල මත්ද්‍රව්‍ය දුර්භාවිතය සම්බන්ධව ඒවාට ගැළපෙන ආයතනික චර්යා පද්ධතීන් ස්ථාපනය කරනු ඇත.

ඇ. මත්ද්‍රව්‍ය ගැන හා මත්ද්‍රවය දුර්භාවිතය ගැන තහවුරු වූ හා විද්‍යාත්මක තොරතුරු අධ්‍යාපන ආයතනවලට සහ පුස්තකාලවලට ලබාදෙනු ලැබේ.

ඈ. මත්ද්‍රව්‍ය පාවිච්චිය හා මත්ද්‍රව්‍ය සම්බන්ධ අපරාධ අවමන් කොට සැලකීම රජයේ හා පෞද්ගලික මාධ්‍ය ආයතන විසින් අනුගමනය කරනු ලබන නිවාරණ ප්‍රතිපත්තිය වේ.

ඉ. ප්‍රාථමික මට්ටමෙන් ඉහළ සෑම පාසලක් සඳහාම නිසි උපදේශන පහසුකම් ලබාදිය යුතුය.

ඊ. තරුණයන්ගේ අවදානම් චර්යා අවම කිරීම සඳහා ඔවුන්ගේ තීරණ ගැනීමේ දක්ෂතා, අධ්‍යාත්මිකතාව හා සදාචාරාත්මක වටිනාකම් වැඩිදියුණු කිරීමට සියලු අධ්‍යාපන ආයතන (පාසල්, කාර්මික විද්‍යාල, විශ්ව විද්‍යාල), තරුණ සේවා ආයතන සහ වෙනත් තරුණ සංවිධාන වැඩසටහන් සම්පාදනය කරනු ඇත.

උ. නිවාරණයේදී මත්ද්‍රව්‍ය විශේෂී නොවන ප්‍රවේශ විධි භාවිතයට ගැනීම දිරිමත් කරනු ලැබේ.

ඌ. මත්ද්‍රව්‍ය නිවාරණයේදී පළාත් අධිකාරිවල හැකියා වර්ධනයට ප්‍රමුඛතාව ලැබිය යුතුය. සෑම පළාත් සභාවකම මත්ද්‍රව්‍ය නිවාරණ කාර්ය සාධක හමුදාවක් ක්‍රියාත්මකව තබනු ලැබේ.

එ. ප්‍රජා සේවා මට්ටමේ රාජ්‍ය නිළධාරීන්, විශේෂයෙන්ම සෞඛ්‍ය කාර්ය මණ්ඩලය, සමාජ සේවා නිළධාරීන්, පරිවාස නිළධාරීන් සහ සමෘද්ධි කාර්ය මණ්ඩලයත්, තෝරාගත් රාජ්‍ය නොවන සංවිධාන කාර්ය මණ්ඩලයත්, ආගමික නායකයින් හා ස්වේච්ඡා සේවකයින් ඇතුළු ජනතා නායකයින් සඳහා මූලික උපදේශන කිසලතා ඇතුළත් මත්ද්‍රව්‍ය නිවාරණයෙහි නිසි පුහුණුවක් දෙනු ලැබේ.

ඒ. වෛද්‍ය පීඨ / වෛද්‍ය විද්‍යාල මගින් වෛද්‍ය සිසුන් සඳහා මත්ලෝලීත්වය සම්බන්ධව ප්‍රමාණවත් පුහුණුවක් ලබාදෙනු ඇත.

ඓ. රාජ්‍ය නොවන සංවිධාන, ප්‍රජා සංවිධාන සහ සේවා සංවිධානවලට මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා වඩා විශාල දායකත්වයක් ලබාදිය හැකිවන පරිදි ඒවාට තාක්ෂණික හා වෙනත් සහායන් ලබාදෙනු ලැබේ.

ඔ. මත්ද්‍රව්‍ය දුර්භාවිතයෙහි සියලු අංශ පිළිබඳ වසංගත රෝග විද්‍යා, සමාජයීය හා විද්‍යාත්මක පර්යේෂණ දිරිමත් කරනු ලැබේ.

ඕ. මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්වලට එච්අයිවී/ඒඩ්ස් නිවාරණ ක්‍රමෝපායන් ඇතුළත් කොට ඊට අදාළ ස්වේච්ඡා පරීක්ෂණ දිරිමත් කරනු ලැබේ.

ඖ. මත්ද්‍රව්‍ය දුර්භාවිතය හා සම්බන්ධව තමින්ගේ මාධ්‍ය ආචාර ධර්ම පද්ධතියක් පවත්වාගෙන යාමට මාධ්‍ය ආයතන උනන්දු කරනු ලැබේ.

## 2.3.2 මත්ලෝලීන්ට ප්‍රතිකාර කිරීම හා ඔවුන් පුනරුත්ථාපනය කිරීම

අ. මත්ලෝලීන් ප්‍රතිකාර සේවා ලබාගත යුතුය. මත්ලෝලීන්ට මෙන්ම ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් සඳහා තම ප්‍රදේශවලදීම ප්‍රමාණවත් උපදේශන හා ප්‍රතිකාර සේවා (නේවාසික ප්‍රතිකාර, ප්‍රජා කණ්ඩායම් මූලික ප්‍රතිකාර හා වෙනත්) සලසා දීමට මධ්‍යම රජය, පළාත් සභා හා පළාත් ආණ්ඩු ක්‍රියා කරනු ඇත

ආ. රක්ෂිත බන්ධනාගාර / ඊකවරණ ස්ථාන, බන්ධනාගාර සහ වෙනත් විශෝධනාගාර තුළ මත්ලෝලීන් වෙනුවෙන් උපදේශන හා ප්‍රතිකාර පහසුකම් සලසා තිබිය යුතුය.

ඇ. මත්ලෝලීන් සියලුදෙනාටම එකම ආකාරයේ ප්‍රතිකාර ක්‍රම නොගැලපේ. එබැවින් රජයට පිළිගතහැකි විවිධ ආකාරයේ ප්‍රතිකාර ක්‍රම හඳුන්වාදීම උනන්දු කෙරේ.

ඈ. උපදේශනය (තනිව සහ / හෝ කණ්ඩායම් වශයෙන්) සහ වෙනත් චර්යා චිකිත්සා ක්‍රම මත්ලෝලීන් සඳහා වන සාර්ථක ප්‍රතිකාර පද්ධතියක අතිශය වැදගත් අංගයක් වෙයි. සෑම ප්‍රතිකාර ක්‍රමයකදීම එම අංග ප්‍රමාණවත් තරමින් ඇතුළත් කරනු ලැබේ.

ඉ. වඩා ඉහළ සාර්ථකත්වයක් සඳහා, වෛද්‍ය සේවා මැදිහත්වීම් **(medical interventions),** උපදේශනය හා චර්යා චිකිත්සා ක්‍රම සමග ඒකාබද්ධ කරනු ලැබේ. මත්ලෝලීන් සඳහා ප්‍රතිකාර සපයන වෛද්‍ය සේවාවල ප්‍රතිකාර වැඩසටහන්වලට උපදේශන හා චර්යා චිකිත්සා මූලිකාංග ඇතුළත් කරන ලෙස උනන්දු කරවනු ලැබේ. පෞද්ගලික වෛද්‍ය වෘත්තිකයින් විසින්ද මෙම ප්‍රතිපත්තියම අනුගමනය කිරීම අවශ්‍ය වේ.

ඊ. සෑම ප්‍රතිකාර වැඩසටහනක්ම මානව හිතවාදී, පිරිවැය ඵලදායී සහ අවසානයේදී සේවා සම්පාදකට මෙන්ම සේවාදායකයාටද දරාගත හැකි අන්දමේ එකක් විය යුතුය. ප්‍රජා හා පවුල්වල මූලික ප්‍රතිකාර සේවා දිරිමත් කරනු ලබන්නේ මෙම අදහස ඇතිවය.

උ. සියලු ප්‍රතිකාර මැදිහත්වීම් වලදී පසු රැකබලා ගැනීම හා පුනරුත්ථාපනය අත්‍යවශ්‍ය අංගයක් වේ. එමෙන්ම මත්ලෝලීන්ගේ පවුලේ සාමාජිකයින්ට සේවා සැපයීමද ධෛර්යමත් කෙරේ.

ඌ. ප්‍රථිකාර වැඩසටහන් මගින් එච් අයි වී / ඒඩ්ස් රෝගය මෙන්ම ලිංගිකව බෝවන අනෙක් සමාජ රෝගද, හෙපටයිටීස් බී සහ සී මෙන්ම ක්ෂය රෝගය පිළිබඳවද පරීක්ෂණ කරනු ඇත. එමෙන්ම රෝගීන්ට තමන් මෙන්ම අන්‍යයන්ද මෙම රෝගවලට භාජනය වීමේ අවදානමට පාත්‍ර කරවන චර්යා නිවැරදි කර ගැනීමට හෝ වෙනස් කර ගැනීමට අවශ්‍ය උපදේශන සපයයි.

එ. ප්‍රතිකාර ලබාදීමේදී ස්ත්‍රී පුරුෂ සමානත්ව ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට ප්‍රතිකාර සපයන්නන් උනන්දු කරවනු ලැබේ. කාන්තා සංවර්ධනය සම්බන්ධයෙන් වගකීම් දරන රාජ්‍ය ආයතනවලත්, රාජ්‍ය නොවන අංශයේ කාන්තා සංවිධානවලත්, මේ පිළිබඳ උනන්දුවක් දක්වන වෙනත් සංවිධානවලත් අවධානය මේ සඳහා යොමුකරවනු ලැබේ.

ඒ. දැනට මත්ද්‍රව්‍ය පාවිච්චියට ඇබ්බැහි වී සිටින්නන් මෙන්ම මුලදී ඊට ඇබ්බැහිව සිටියවුන්ද හැකිතාක් දුරට වගකීම් හා බැඳීම් සහිත සාමාන්‍ය පුද්ගලයින් පිරිසක් වශයෙන් සලකනු ලැබේ.

ඓ. මත්ලෝලීන්ට ප්‍රතිකාර කිරීමටත්, ඔවුන්ට පුනරුත්ථාපනය සැලසීමටත් හැකිවන පරිදි රාජ්‍ය නොවන සංවිධානවල හැකියා වර්ධනය දිරිමත් කරනු ලැබේ.

ඔ. රාජ්‍ය අංශයේ ආයතන, පෞද්ගලික අංශය, රාජ්‍ය නොවන සංවිධාන සහ වෙනත් අය විසින් සපයනු ලබන ප්‍රතිකාර සේවා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය විසින් නිරීක්ෂණය කරනු ඇත.

## 2.4 කලාපීය හා ජාත්‍යන්තර වැඩසටහන් සඳහා සහයදීමේ ප්‍රතිපත්ති රාමුව

කවර රටකට හෝ තම මත්ද්‍රව්‍ය පිළිබඳ ගැටළුව තනිව විසඳාගත් නොහැකි බව පිළිගෙන ඇත. එබැවින් රජය විසින් ද්විපාර්ශ්වික, කලාපීය හා ජාථ්‍යන්තර වශයෙන් විධිමත් සහයෝගතා වැඩපිළිවෙලක අනලස්ව නිරත වීමට අදාල සංවිධාන උනන්දු කරවනු ඇත.

අ. අදාල සියලු ආයතන රජය විසින් පිළිගනු ලැබූ කලාපීය හා ජාථ්‍යන්තර වැඩසටහන් වලට ආධාර හා සහය දී එම ක්‍රියාමාර්ගයන්හි ප්‍රමාණවත් ලෙස නිරත වෙයි.

ආ. කලාපීය / ජාථ්‍යන්තර සහයෝගී ක්‍රියාකාරිත්වයකින් යුත් යාන්ත්‍රණයක් සහිත රාජ්‍ය නොවන සංවිධාන තුලින් කලාපීය හා ජාථන්තර සහයෝගීතාව දිරිමත් කරනු ලැබේ.

# 3. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ කාර්ය භාරය

3.1 1984 අංක 11 දරන අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩල පනත මගින් දී ඇති බලය ප්‍රකාර මත්ද්‍රව්‍ය දුර්භාවිතය නිවාරණය කිරීමේ හා පාලනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තිය මණ්ඩලය විසින් නිරීක්ෂණය කොට සමාලෝචනය කෙරේ. මණ්ඩලය ජාතික කේන්ද්‍රීය ලක්ෂය වශයෙන් ක්‍රියා කරමින් අදාළ සියලු සංවිධානයන්හි මත්ද්‍රව්‍ය පාලන කටයුතු සම්බන්ධීකරණය කරනු ඇත

3.2 මණ්ඩලය විසින් ඉටු කරනු ලබන කාර්ය භාරය සාක්ෂි මත පදනම් වූ ප්‍රතිපත්ති හා උපායන් පැහැදිලි කොට අනුග්‍රහය දීමෙන්ද, වෙනස්කම් දිරිගැන්වීමෙන් හා හවුල් කටයුතු වර්ධනය කිරීමෙන්ද, තොරතුරු කළමනාකරනයෙන් හා පර්යේෂණ පැවැත්වීමෙන්ද, ප්‍රතිමාන හා ප්‍රමිති නියම කොට ක්‍රියාත්මක භාවයට පත් කිරීමෙන් ද, නව තාක්ෂණ උපකරණ හා මාර්ගෝපදේශ වර්ධනය කොට අත්හදා බැලීමෙන්ද අවධරණය කරනු ලැබේ.

3.3 එසේම පුළුල්වන කාර්ය භාරය, වඩා ප්‍රායෝගික තත්ත්වයට පත්කරලීම සඳහා මණ්ඩලය රජයෙන් හා වෙනත් මූලාශ්‍ර වෙතින් සම්පත් ලබා ගනිමින් අරමුදල් ලැබ රජයේත් පෞද්ගලික අංශයේත්, රාජ්‍ය නොවන සංවිධාන අංශයේත් හවුල් කටයුතු දිරිමත් කරන්නේය.

# 4. ප්‍රධාන පාර්ශවකරුවන්

අහත සඳහන් නිළධාරීන් / ආයතන මෙම ජාතික ප්‍රතිපත්තිය ජාතික මට්ටමින් සාර්ථකව ක්‍රියාවේ යෙදවීමෙහිලා මූලික වේ.

01. පොලිස්පති
02. පළාත් ප්‍රධාන ලේකම්වරු
03. දිස්ත්‍රික් ලේකම්වරු
04. රේගු අධ්‍යක්ෂ ජනරාල්
05. සුරාබදු කොමසාරිස් ජනරාල්
06. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
07. සෞඛ්‍ය සේවා පළාත් අධ්‍යක්ෂවරු
08. අධ්‍යක්ෂ එච්අයිවී / ඒඩ්ස් වැඩසටහන
09. ලේකම්, අධ්‍යාපන අමාත්‍යංශය
10. බණ්ඩනාගාර කොමසාරිස් ජනරාල්
11. සමෘද්ධි කොමසාරිස් ජනරාල්
12. රාජ්‍ය ව්‍යවසාය පිළිබඳ අධ්‍යක්ෂ ජනරල්
13. ජාතික අයවැය අධ්‍යක්ෂ
14. රජයේ රස පරීක්ෂක
15. නීතිපති
16. නීති කෙටුම්පත් සම්පාදක
17. ආයුර්වේද කොමසාරිස්
18. යුධ හමුදාපති
19. නාවික හමුදාපති
20. ගුවන් හමුදාපති
21. අධ්‍යක්ෂ, පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය
22. ප්‍රවෘත්ති අධ්‍යක්ෂ
23. කම්කරු කොමසාරිස් ජනරාල්

24. ජාතික තරුණසේවා සභාවේ සභාපති
25. අධ්‍යක්ෂ, වෛද්‍ය සැපයුම් අංශය
26. සමාජසේවා අධ්‍යක්ෂ ජනරාල්
27. අධ්‍යක්ෂ ජනරාල්, වතු නිවාස හා සමාජ සුභසාධන අමාත්‍යාංශය
28. අධ්‍යක්ෂ, එක්සත් ජාතීන් (විදේශ කටයුතු අමාත්‍යාංශය
29. අධ්‍යක්ෂ, සාර්ක් (විදේශ කටයුතු අමාත්‍යාංශය
30. ආනයන හා අපනයන පාලක
31. නගරාධිපතිවරු / නාගරික කොමසාරිස්වරු
32. ශ්‍රී ලංකා මත්ද්‍රව්‍ය භාවිතය පිටුදැකීමේ රාජ්‍ය නොවන සංවිධානයන්ගේ ඒකාබද්ධ සම්මේලනය **(SLFONGOADA)**
33. ලංකා සේවා නියුක්තිකයින්ගේ සම්මේලනය
34. පෞද්ගලික අංශයේ සංවිධාන

මෙම ප්‍රතිපත්තිය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රධාන පාර්ශවකරුවෝ, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය හා සමීප සබඳතාවයකින් යුතුව ක්‍රියා කරනු ඇත.

**++++++**